*සැ. යු.*– 2007.01.26 දින පළවූ අංක 1,482 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළනොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,483 — 2007 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා — 2007.02.02**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | – |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 67 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජනවාරි මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

65 -B 079439- 9,650 (2007/02)

## විභාගාපේක්ෂකයන් සඳහා නීති හා උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතීන්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කල යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කළින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා පොලිසිය

### සහකාර පොලිස් අධිකාරිවරුන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය - 2007

මෙම නිවේදනයේ "කොමිෂන් සභාව" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ජාතික පොලිස් කොමිෂන් සභාවය.

01. විභාගය :

1.1 සහකර පොලිස් අධිකාරිවරුන් තෝරා ගැනීම සඳහා විවෘත තරග විභාගයක් කොළඹදී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

1.2 මෙම තනතුර ස්ථිරය, දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාළ වනු ඇත.

1.3 පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

1.4 මහජන යහපත උදෙසා ඇබෑර්තු පිරවිය යුතු නොවේ යැයි ජාතික පොලිස් කොමිෂන් සභාව තීරණය කළ හොත් මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ හැකිය.

02. සුදුසුකම්

2.1 විභාග අපේක්ෂකයෙකු :

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු විය යුතුය.
(ඈ) යහපත් චරිතයක් ඇත්තෙකු විය යුතුය.
(ඉ) අවිවාහකයෙකු විය යුතුය.
(ඊ) මනා දේහ විලාශයකින් ද, දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.
(උ) උපැස් හෝ සප්ර්ශ කාචයක් නොපැළඳ ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද වර්ණ පෙනීම සාමාන්‍ය ද විය යුතුය.
(ඌ) පිරිමි අපේක්ෂකයන් සඳහා අවම වශයෙන් උස අඩි 05 යි අඟල් 6 ක් විය යුතුය. කාන්තා අපේක්ෂකයන් සඳහා අවම වශයෙන් උස අඩි 05 යි අඟල් 4 ක් විය යුතුය.

*සටහන*- 1. අනෙකුත් සුදුසුකම් සපුරා තිබේ නම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇති පොලිස් නිළධාරීන්ට ද බාහිර අයදුම්කරුවන් ලෙස විභාගයට පෙනී සිටිය හැක. එම ඉල්ලුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. විවාහක පොලිස් නිලධාරීන්ට ද ඉල්ලුම් කළ හැකිය.

*සටහන* 2. අවශ්‍ය ශාරීරික අවශ්‍යතාවන්ගෙන් අඟල් බාගයක් අඩු වුවත්, අනෙකුත් අවශ්‍යතාවයන් සපුරාලන්නා වූ රට තුළ හෝ රටින් පිට ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රීඩා සඳහා පෙනී සිටි විශිෂ්ට ක්‍රීඩකයෙකු නම් හෝ ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ක්‍රීඩා උත්සව සහ තරඟවලදී ප්‍රශංසනීය ලෙස කුසලතාවන් දක්වා තිබේ නම් එම අපේක්ෂකයින් බඳවා ගැනීමේ අයිති ජාතික පොලිස් කොමිෂන් සභාව සතුය.

03. වැටුප් පරිමාණය :

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව එස්.එල්. 1-2006 වැටුප් පරිමාණය අදාළ වේ. ඒ අනුව,
මාසික වැටුප් පරිමාණය
රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x1,050 - රු. 53,555
(රු. 24,870 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

04. තෝරා ගැනීමේ ක්‍රමවේදය :

අයදුම්කරුවන් තෝරා ගැනීමේ ක්‍රම වේදය පහත පරිදිය.

4.1 මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය

ලැබී ඇති අයදුම්පත් අතරින්, අයදුම්කරුවන් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයේදී,

අ. උස සහ පපුව (පිරිමි) පරීක්ෂා කරනු ලබයි.

ආ. සහතිකවල මුල් පිටපත් පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

4.2 ඔරොත්තු දීමේ පරීක්ෂණය :

මූලික සුදුසුකම් සපුරණ අයදුම්කරුවන් ඉන්පසු ඔරොත්තු දීමේ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

පොලිස්පති විසින් තීරණය කරනු ලබන ස්ථානයකදී අධ්‍යක්ෂ බඳවා ගැනීම්ගේ අධීක්ෂණය යටතේ මෙම පරීක්ෂණය පවත්වනු ලැබේ. අයදුම්කරුවන් මෙම පරීක්ෂණයට භාජනය වීමට සුදුසු ශාරීරික යෝග්‍යතාවයෙන් සිටීදැයි යන්න පරීක්ෂා කිරීම පිණිස පොලිස් රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂණයට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ඇත.

ඔරොත්තු දීමේ පරීක්ෂණ ක්‍රම වේදය - පිරිමි අපේක්ෂකයෙකු නම් විනාඩි 03 තප්පර 54 කින්ද, කාන්තා අපේක්ෂකයෙකු නම් විනාඩි 05 තත්පර 24 කින්ද මීටර් 1000 ක දුර ප්‍රමාණයක් අඛණ්ඩව දිවීම.

*සටහන* 1 - පොලිස් සේවයේ නියුතු අයදුම්කරුවන් දැනටමත් බඳවා ගැනීමේදී ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිට ඇති බැවින් නැවත ඔරොත්තුදීමේ පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය නොවනු ඇත.

4.3 ලිඛිත විභාගය :

මූලික සුදුසුකම් සපුරා ඇති හා ඔරොත්තුදීමේ පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගය සඳහා කැඳවීම් කරනු ලැබේ. ලිඛිත විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර පහත සඳහන් විෂයන්ගෙන් සමන්විතය. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ කාලය සහ ලකුණු පහත පරිදිය.

(01) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි- ලකුණු 100
(02) සාමාන්‍ය දැනීම -කාලය පැය 01 යි - ලකුණු 100
(03) භාෂා ප්‍රවීනතාව (අවබෝධය හා වාක්‍ය රචනය) - කාලය පැය 02 යි - ලකුණු 100

4.4 වාචික පරීක්ෂණය :

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ වාචික පරීක්ෂණය පැවැත්වේ.

වාචික පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් වෙන් වේ.

*සටහන් I* : මෙම පරීක්ෂණ සඳහා කැඳවන අපේක්ෂකයින් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයක් වනු ඇත. මෙම පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේදී යටත් පිරිසෙයින් එක් එක් විෂයකින් 40% ක් වත් ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ එම ලකුණුවල එකතුවට අනුව සකස් කළ ප්‍රමුඛතා ලේඛනයෙනි.

*සටහන II* : ලිඛිත විභාගයේදී ලද ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් නොකරනු ඇත.

4.5 පසුබිම් පරීක්ෂණය :

අයදුම්කරුවන්ගේ යහපත් චරිතය සහ හැසිරීම පිළිබඳව සලකා බැලීම පිණිස ඔහුගේ සහ ඔහුගේ ලඟම ඥාතීන් සහ හඳුනන අය පිළිබඳව පසුබිම් වාර්තාවක් ලබාගනු ඇත.

අපේක්ෂකයෙකු බඳවා ගැනීමේදී අසත්‍ය තොරතුරු සපැයීම හෝ අයහපත් පසුබිම් වාර්තාවක් ඇත්තෙකු වීම බඳවා නොගැනීමට හෝ බඳවා ගැනීමෙන් පසු සේවය අවලංගු කිරීමට හෝ හේතු වනු ඇත.

4.6 වෛද්‍ය පරීක්ෂණ :

තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින්, දිවයිනේ ඕනෑම පළාතක පොලිස් නිලධාරියෙකු ලෙස සේවය කිරීම සඳහා ඔවුන් සතුව ඇති ශාරීරික යෝග්‍යතාව පිළිබඳ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

4.7 පුහුණුවට කැඳවීම :

වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් පමණක් පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

05. විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් විය යුතුය.

(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම විභාගයේදී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂය එක භාෂාවකිනුත්, අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* - i. ඉහත (ආ) සහ (ඇ) හි සුදුසුකම් ලත් විභාගය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 2.1 ඇ ඡේදයේ සහ 2.1 හි සටහන 1 හි ඇති විභාගය වේ.

ii. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

iii. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

06. විෂය නිර්දේශය :

(01) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි - ලකුණු 100 යි.

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු විෂයෙහි අපේක්ෂකයින් දක්වන අනුමාන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයින් සතු හැකියාව ඇගයීම.

(02) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි - ලකුණු 100 යි.

ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම.

(03) භාෂා ප්‍රවීනතාව( අවබෝධය හා වාක්‍ය රචනය) කාලය පැය 02 යි. ලකුණු 100 යි.

දෙන ලද මාතෘකා/තේමා සමූහයකින් අපේක්ෂකයා තෝරා ගත් මාතෘකාවක්/තේමාවක් මනසින් ග්‍රහණය කොට විචාර බුද්ධියෙන් සළකා බැලීමේ හැකියාව සහ ඒ පිළිබඳ තොරතුරු හා අදහස් ඒකරාශි කොට ගෙන සංවිධානයෙන් යුතුව ඉදිරිපත් කිරීමේ ශක්තිය පරීක්ෂා කිරීම සහ සැළකිය යුතු තරම් සංකීර්ණ වූ ඡේදයක් හෝ ලේඛන ඛණ්ඩයක් හෝ සංදේශයක් හෝ අවබෝධ කර ගෙන එහි ඇති මුඛ්‍ය අදහස් සැකෙවින් හා පැහැදිලිවත්, නිවැරදිවත් අපේක්ෂකයාගේම වචනවලින් ප්‍රකාශ කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම.

07. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුනා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 x12 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයාම පිරවිය යුතුය. 1-5 දක්වා වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමුවෙනි පැත්තේ ද, 6-10 දක්වා ශීර්ෂ එහි අනිත් පැත්තේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම විය යුතුය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2007.03.02 වැනි දින හෝ ඊට කලින් හෝ ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව, 3 වන මහල, රොටුන්ඩා ටවර්, අංක 109, ගාලු පාර, කොළඹ 03 වෙතට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ ඉහළ වමත් පස කෙළවරේ, "සහකාර පොලිස් අධිකාරිවරුන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය : 2007" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පතක් භාර ගනු නොලැබේ.

(ඈ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලසා බලනු නොලැබේ.

08. ගාස්තු :

8.1.1 ඇතුලත්වීමේ ගාස්තුව රුපියල් 300 කි.

8.1.2 මෙම ගාස්තුව ආදායම් ශීර්ෂ 4000-20-03-20-13 ට බැර කරන ලෙසට උපදෙස් සහිතව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ආසන්නව පිහිටි දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවිය යුතුය. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත් ලදුපත් කුවිතාන්සි ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. ඉල්ලුම් පත්‍රයේ හා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8.2 මෙම ගාස්තුව සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

09. අයදුම්පත් භාර ගැනීම :

9.1 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවනට මූලික පරීක්ෂණය හා ඔරොත්තුදීමේ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි නිකුත් කළ විගසම පුවත්පත්වල දැන්වීමක් පළ කරනු ලැබේ. එවැනි දැන්වීමක් පිළිබඳව විමසිල්ලෙන් සිටින ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

9.2 මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් හා ඔරොත්තු දීමේ පරීක්ෂණයෙන් පසු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන ලේඛනය සමග වන ඉල්ලුම්පත්‍ර සඳහා විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර, අත්සන සහිතක කරවාගෙන විභාග මධ්‍යස්ථානය භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. එසේ කිරීමට අසමත් වන අපේක්ෂකයන්ට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

9.3 ඉල්ලුම්කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුතුය. තමන්ට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාග ශාලාවකදී කිසිම විභාග අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

9.4 විභාගයට යටත් පිරිසෙයින් දින 07 කටවත් කලින් ප්‍රවේශ පත්‍ර නොලැබුන විභාග අපේක්ෂකයින් ඒ බව වහාම විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතුය. ඔහුට මේ බව දැනුම් දෙන විට පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය.

1. විභාගයේ නම : ..................................................
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................
3. සම්පූර්ණ ලිපිනය : ..................................................
4. අයදුම්පත එවූ තැපැල් කාර්යාලය, ලියාපදිංචි කල අංකය හා දිනය : ..................................................
5. මුදල් ගෙවන ලද ස්ථානය, මුදල් ගෙවූ දිනය හා ලදුපත් අංකය : ..................................................

9.5 විභාගයට ඇතුළත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් ලෙසට අදහස් නොකෙරේ.

10. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :

10.1 දැනට රජයේ සේවයේ යෙදී සිටින අපේක්ෂකයින්ගේ අත්සන් සහතික කළ යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ විසිනි.

10.2 අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් සහතික කළ යුත්තේ එසේ කිරීමට බලය ලත් කෙනෙකු විසිනි. එනම්, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස් වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු හෝ රු. 233,580 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසිනි.

11. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

අපේක්ෂකයින් විසින් තමන් පෙනී සිටින එක් එක් විෂය සඳහා විභාග ශාලාවේදී ශාලාධිපති සෑහීමට හේතු වන පරිදි තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

12. වැරදි තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම් :

මෙම විභාගයට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු එයට පෙනී සිටීමට නුසුදුසුයැයි පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු විසින් උවමනාවෙන්ම කිසියම් වැදගත් කාරණයක් වසන් කරන ලද නම් හෝ බඳවා ගැනීමෙන් පසු ඔහු රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

13. ලියකියවිලි :

මතු දැක්වෙන මුල් ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කළ විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කළ යුතු වේ.

(අ) උප්පැන්න සහතික පත්‍රය (පාඨශාලාවල භාවිතය සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බෞතීස්ම සහතිකය හෝ මේ සඳහා පිළිගනු නොලැබේ.)
(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර
(ඇ) පාසැල්වලින් ලබා ඇති සහතික ද ඇතුළුව චරිත සහතික 04 කට නොවැඩි ගණනක්. එම සහතික අතුරින් අඩු වශයෙන් එකක්වත් තම අධ්‍යයන උපදේශකවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් හෝ ලබා ගත් එකක් විය යුතුය.

14. අයථා අනුග්‍රහයන් :

යම් අපේක්ෂයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑමකට හෝ උත්සායක් දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වනු ඇත.

15. බඳවා ගැනීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය, පත්විම්ලාභීන් දායක විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමයට ඇතුළත් විය යුතුය.
(ii) බඳවා ගත් දින සිට මාසික ඉපැයීම්වලින් 8%ක් දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතුය.
(iii) සියලුම නිලධාරීන් පොලිස් දෙපාර්තමේන්තු අරමුදල්වලට දායක වීම අවශ්‍ය වේ.

16. පොදු කොන්දේසි :

ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* (II) "අ" කොටසේ මුලින්ම පළ වී ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරු වලට අදාළ පත්වීම් පිළිබඳ පොදු කොන්දේසි වෙත ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ.

17. මෙම දැන්වීමෙන් විධි විධාන සැලසී නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් එය ජාතික පොලිස් කොමිෂන් සභාවේ අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. සී. ලෝකේෂ්වරන්,
ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

ජාතික පොලිස් කොමිෂන් සභාව,
රොටුන්ඩා ටවර්,
තුන්වන මහළ,
අංක 109,
ගාලුපාර,
කොළඹ 03.
දිනය : 2007.01.18

ආදර්ශ අයදුම් පත්‍රය

ශ්‍රී ලංකා පොලීසිය

*සහකාර පොලිස් අධිකාරීවරුන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය - 2007*

*Open Competitive Examination for Selection of Assistant Superitnedents of Police - 2007*

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(සිංහල -2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා :-SILVA, A. B).

1.2 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්):————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

1.5 නිකුත් කළ දිනය : ☐

2.0 ලිපිනය :

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්, අදාළ නම් පමණි)
:————.

2.4 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
:————.

3.0 3.1 ජන වර්ගය : ☐
සිංහල 1, දෙමළ 2, ඉන්දියානු දෙමළ 3, මුස්ලිම් 4, වෙනත් 5
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ස්ත්‍රී පුරුෂ භාවය : ☐
ස්ත්‍රී 1, පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3. විවාහක/අවිවාහක බව : ☐
විවාහකයි -1 අවිවාහකයි -2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.4 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.5 2007.03.02 දිනට වයස :
අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

4.0 (i) උපාධිය ලද දිනය :————.
(ii) විශ්ව විද්‍යාලය/ආයතනය :————.
(iii) ලියාපදිංචි වූ අංකය හා දිනය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.
(v) උපාධිය :————.
(vi) විෂයයන් :————.
(vii) පන්තිය :————.
(viii) ඉහළ/පහළ :————.
(ix) විභාග අංකය :————.
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

5.0 ශාරීරික යෝග්‍යතාවය :
(i) උස : අඩි :————. අඟල් :————.
(ii) පපුව (ප්‍රසාරණය කළ විට) : අඟල් :————.
(පිරිමි අයදුම්කරුවන්ට පමණි)

6.0 ඔබ දැනට පොලිස් නිලධාරියෙකු වශයෙන් පත්වීම් උසුලන්නේ ද?
:————.
එසේ නම් දැනට දරන තනතුර හා පත්වීම ලැබූ දිනය සඳහන් කරන්න
:————.

7.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

8.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, ............ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇතුලත්වීමේ ගාස්තු ගෙවන ලද අංක ............ හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම(*ගැසට් නිවේදනයේ* 10 වැනි ඡේදය පරිදි විය යුතුය):

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ............ දින ඔහුගේ/ඇයගේ අත්සන ............ දින මා ඉදිරියේදී තැබූ බවත් මම සහතික කරමි.

————————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නම් පමණි) :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........... මයා/මිය/මෙනෙවිය ........... දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.
දිනය :————.

02-128

## කම්කරු දෙපාර්තමේන්තුව

### කම්කරු නිලධාරීන් බඳවා ගැනීමේ තරග විභාගය - 2006

ඉහත විභාගය සම්බන්ධයෙන් 2006.11.24 දින අංක 1,473 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද නිවේදනයේ පහත සඳහන් සංශෝධන සිදුකරනු ලැබේ :

ඉහත *ගැසට් නිවේදනයේ* "(02) තනතුරට අදාළ වැටුප් ක්‍රමය" ට පසුව එන සටහනට පෙරාතුව තිබෙන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

"රා.පරි.ච. 20/2001 අනුව පත්වීම් දින සිට වසර 3 ක් ඇතුළත හෝ 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම ද, පත්වීම් දින සිට වසර 06 ක් ඇතුළත හෝ වැටුප් ක්‍රමයේ 7 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම ද, සමත් විය යුතුය."

මහින්ද මඩිහහේවා,
ලේකම්, කම්කරු සබඳතා සහ විදේශ රැකියා
නියුක්ති අමාත්‍යාංශය.

02-165

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

## 1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩි කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයඩි පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ඡේදය | 520 0 | 1,007 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 0 |
| III වන ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ ගාස්තුව රු. ශ. | තැපැල් (මෙරට) රු. ශ. |
|---|---|---|
| (අ) I වන කොටස | 31 0 | 5 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) I වන ඡේදය | 10 0 | 5 0 |
| II වන ඡේදය | 12 0 | 5 0 |
| III වන ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.-* මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| පෙබරවාරි | 2007.02.02 | සිකුරාදා | 2007.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.09 | සිකුරාදා | 2007.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.15 | බ්‍රහස්පතින්දා | 2007.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.23 | සිකුරාදා | 2007.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2007.03.02 | සිකුරාදා | 2007.02.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.03.09 | සිකුරාදා | 2007.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.16 | සිකුරාදා | 2007.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.23 | සිකුරාදා | 2007.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.30 | සිකුරාදා | 2007.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2007.04.05 | බ්‍රහස්පතින්දා | 2007.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.12 | බ්‍රහස්පතින්දා | 2007.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.20 | සිකුරාදා | 2007.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.04.27 | සිකුරාදා | 2007.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.